# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බළසේනාවේ ඉංජිනේරු, ගණක සහ තොරතුරු තාක්‍ෂණ වෘත්තිය නිලධාරීන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම්ළත් වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත දක්වා ඇති නිලයන්හි අධිකාරියට පත් කරනු ලැබේ.**

| තනතුර | නිලය | ස්ත්‍රී/පුරුෂ භාවය | 2017.06.30 දිනට වයස | අධ්‍යාපන හා වෘත්තියමය සුදුසුකම් |
|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු | කපිතන් | පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේදී/ තාක්‍ෂණවේදී සිවිල් ඉංජිනේරු උපාධි පාඨමාලාව සමත්වීම හා අදාළ ක්ෂේත්‍රයේ වසර 2 1/2 ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>2. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම හා සිවිල් ඉංජිනේරුවෙකු වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 2 1/2 ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. |
| සහයක සිවිල් ඉංජිනේරු | ලුතිනන් | පුරුෂ (අවිවාහක) | අවුරුදු 28ට නොවැඩි | 1. මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ජාතික තාක්‍ෂණ විද්‍යා ඩිප්ලෝමා (සිවිල් ඉංජිනේරු) පාඨමාලාව සමත්වීම. (අවම වශයෙන් අවුරුදු 03ක පූර්ණ කාලීන පාඨමාලාවක් විය යුතුය.)<br>හෝ<br>2. මට්ටක්කුලිය උසස් තාක්‍ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික තාක්‍ෂණ ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල් ඉංජිනේරු) පාඨමාලාව සමත්වීම. (අවම වශයෙන් අවුරුදු 03ක පූර්ණ කාලීන පාඨමාලාවක් විය යුතුය.)<br>හෝ<br>3. කටුනායක ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා (සිවිල් ඉංජිනේරු) පාඨමාලාව සමත්වීම. (අවම වශයෙන් අවුරුදු 03ක පූර්ණ කාලීන පාඨමාලාවක් විය යුතුය.)<br>4. අදාළ ක්ෂේත්‍රයේ අවම වසර 01ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. |
| ප්‍රමාණ සමීක්ෂක | කපිතන් | පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේදී ප්‍රමාණ සමීක්ෂක උපාධි පාඨමාලාව සමත්වීම සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ වසර 2 1/2 ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>2. ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ ආයතනයේ උපාධි සාමාජිකත්වය (Graduate Member) ලබා තිබීම සහ ප්‍රමාණ සමීක්ෂණය පිළබඳ වසර 2 1/2 ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. |
| සහයක ප්‍රමාණ සමීක්ෂක | ලුතිනන් | පුරුෂ (අවිවාහක) | අවුරුදු 28ට නොවැඩි | 1. මට්ටක්කුලිය උසස් තාක්‍ෂණික ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික තාක්‍ෂණික ප්‍රමාණ සමීක්ෂක ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම. (අවම වශයෙන් අවුරුදු 03 ක පූර්ණ කාලීන පාඨමාලාවක් විය යුතුය)<br>හෝ<br>2. ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ ආයතනයේ තාක්‍ෂණ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම.<br>3. අදාළ ක්ෂේත්‍රයේ අවම වසර 01ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. |
| මිනින්දෝරු | කපිතන් | පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේදී මිනින්දෝරු උපාධි පාඨමාලාව සමත්වීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 2 1/2 ක පශ්චාද් වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. |
| ගණක නිලධාරී | කපිතන් | ස්ත්‍රී/පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගිණුම් (BSc Accounting (sp) or B.Com (sp)) සම්බන්ධ උපාධියක් සමග වරළත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) ගණකාධිකරණය සහ ව්‍යාපාර සහතිකපත් - II (Certificate in Accounting & Business - II) හෝ වරළත් කළමණාකාරීත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA) කළමණාකාරීත්ව මට්ටම (Managerial Level) හෝ සහතිකළත් වරළත් ගණකාධිකාරී සංගමයේ (ACCA) අදියර 2 (Stage II) සමත්ව තිබීම.<br>2. පිළිගත් ආයතනයක ගණකාධිකරණ/විගණනයට අදාළ මාණ්ඩලික ශ්‍රේණියේ වසර 2 1/2 ක පළපුරුද්දක් සහ ගිණුම්කරණ මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුමක් තිබීම. |
| මෘදුකාංග ඉංජිනේරු | කපිතන් | ස්ත්‍රී/පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 04කට නොඅඩු පරිගණක විද්‍යාව/මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන තොරතුරු තාක්‍ෂණ උපාධියක් සාර්ථකව හදාරා නිමකර තිබීම.<br>2. ව්‍යාපෘති සඳහා කරන ලද නිර්මාණ මෙහිදී සැලකිල්ලට ගනු නොලැබේ. පරිගණක මෘදුකාංග ක්‍රම ලේඛනය පිළිබඳ වෘත්තියමය සුදුසුකම් සපුරා තිබීම. PHP Farmworks (yii, Laravel ETC) පිළිබඳව Information Security හා ERP පද්ධති පිළිබඳ පළපුරුද්දක් තිබීම වඩාත් යෝග්‍ය වේ. |
| තොරතුරු පද්ධති ආරක්‍ෂණ විශ්ලේෂක | කපිතන් | පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 04කට නොඅඩු පරිගණක විද්‍යාව/තොරතුරු තාක්‍ෂණ ආරක්‍ෂණය හෝ ඊට සමාන තොරතුරු තාක්‍ෂණ උපාධියක් සාර්ථකව හදාරා නිමකර තිබීම.<br>2. Information Security ක්ෂේත්‍රය සඳහා අවුරදු 2 1/2 ට නොඅඩු පළපුරුද්දක් තිබීම. (Penetration testing, Vuluerability Assessment, Information Security යන අංශ පිළිබඳ පළපුරුද්දක් තිබීම වඩාත් යෝග්‍ය වේ).<br>3. CEH/CHFI/CISP හෝ වෙනත් තොරතුරු ආරක්‍ෂණ ක්‍රම පිළිබඳ වෘත්තියමය සහතිකපත් ලබා තිබිය යුතුය. |
| මෘදුකාංග තත්ව සුරැකුම් ඉංජිනේරු | කපිතන් | ස්ත්‍රී/පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 04කට නොඅඩු පරිගණක විද්‍යාව/මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව හෝ ඊට සමාන තොරුතුරු තාක්‍ෂණ උපාධියක් සාර්ථකව හදාරා නිමකර තිබීම.<br>2. Software QA (Quality Assuarance) පිළිබඳ අවුරුදු 2 1/2 ට නොඅඩු පළපුරුද්දක් තිබීම (Selenium/ Junit යන මෙවලම් භාවිත කර Test Automation සිදුකර තිබීම වඩා යෝග්‍ය වේ). Software QA පිළිබඳ වෘත්තියමය සහතිකපත් තිබීම. Code Level Testing, DBMS පිළිබඳ දැනුමක් තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ. |
| ජාලකරණ ඉංජිනේරු | කපිතන් | පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 04කට නොඅඩු පරිගණක විද්‍යාව/ ජාලකරණ ඉංජිනේරු පිළිබඳව විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන තොරතුරු තාක්‍ෂණ උපාධියක් සාර්ථකව හදාරා නිමකර තිබීම.<br>2. System/Network Administration හෝ Information Security Administration ක්ෂේත්‍රයේ පිළිබඳ අවුරුදු 2 1/2 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.<br>3. Microsoft/Linux/CISCO ආදී තොරතුරු ආරක්‍ෂණ ක්‍රම පිළිබඳ සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| දෘඩාංග ඉංජිනේරු | කපිතන් | පුරුෂ (විවාහක/ අවිවාහක) | අවුරුදු 32ට නොවැඩි | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 04කට නොඅඩු ක්ෂේත්‍රයට අදාළව විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන උපාධියක් සාර්ථකව හදාරා නිමකර තිබීම.<br>2. දෘඩාංග ඉංජිනේරු ක්ෂේත්‍රය පිළිබඳ අවුරුදු 2 1/2 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.<br>3. Micro Controllers, Chip Programming and Electronics & Computer Hardware ක්ෂේත්‍ර පිළිබඳ පළපුරුද්දක් හා දැනීමක් තිබීම වඩාත් යෝග්‍ය වේ. |

## වැටුප් හා අනෙකුත් දීමනා

- ◆ සියලුම දීමනා සහිතව අදාළ නිලයන්ට හිමි මාසික වැටුප පහත සඳහන් පරිදි වේ
  කපිතන් රු: 82784.20 ලුතිනන් රු: 78140.20
- ◆ මෙයට අමතරව ප්‍රවාහන, නිල ඇදුම්, වෛද්‍ය හා නේවාසික පහසුකම් සපයනු ලැබේ.
- ◆ එසේම එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා සහභාගී වීමටද මෙම නිලාධාරීන්ට අවස්ථාව ලැබේ
- ◆ ඉහත සුදුසුකම් සපුරාලන අයවළුන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික, ජාතික හැදුනුම්පත, උප්පැන්න සහතිකය, ග්‍රාම නිලධාරී සහතිකය, චරිත සහතික දෙකක්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකපත්වල ඡායා පිටපත් සමඟ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදංචි තැපෑලෙන් 2017 මැයි 18 වන දින හෝ එදිනට පෙර දක්වා ඇති ලිපිනයට එවිය යුතුය.ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය
- ◆ වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවිය වන www.army.lk වෙත පිවිසෙන්න

## මූලික සුදුසුකම්

- ◆ අවම උස - පුරුෂ අයවළුන් 5′ 6″ කාන්තා අයවළුන් 5′ 3″
- ◆ අවම බර 50kg
- ◆ පපුව 32" නොඅඩු (හුස්ම පිටකර)
- ◆ අ.පො.ස (සා පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන සාමාර්ථ 04 ක් සමග ගණිතය හා සිංහල හෝ දෙමළ විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත් විම.
- ◆ එක් අවස්ථාවකදී අපොස (උ:පෙළ) විභාගයෙන් සාමාන්‍ය සාමාර්ථ 03 ක් සහිතව සහ තුන්වතාවකට නොවැඩි වාර ගණනකදී සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් 30% ලකුණු ප්‍රතිශතයක් ලබා ගෙන සමත්වීම.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2017 මැයි මස 18 දින**

ලිපිනය: පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ
පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය
තැ:පෙ: 553
කොළඹ

**විමසීම්: 011 2058176, 0112553218**